# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 44 දරන සමස්ත ලංකා ශ්‍රී සුමංගල සමාජසේවා සහ සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 සැප්තැම්බර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 සැප්තැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 44 දරන සමස්ත ලංකා ශ්‍රී සුමංගල සමාජ සේවා සහ සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1993 සැප්තැම්බර් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 37/92

**සමස්ත ලංකා ශ්‍රී සුමංගල සමාජ සේවා සහ සුභසාධක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

" සමස්ත ලංකා ශ්‍රී සුමංගල සමාජ සේවා සහ සුභසාධක සංගමය " යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් මිද්දෙනියෙහි පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබූවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත 1993 අංක 44 දරන සමස්ත ලංකා ශ්‍රී සුමංගල සමාජ සේවා සහ සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සමස්ත ලංකා ශ්‍රී සුමංගල සමාජ සේවා සහ සුභ සාධක සංගමය සංස්ථාගත කිරීම.

2. මෙහි මින්මතු " සංගමය " යනුවෙන් සඳහන් කරනු ලබන සමස්ත ලංකා ශ්‍රී සුමංගල සමාජ සේවා සහ සුභසාධක සංගමයෙහි දැනට සාමාජිකයන්ව සිටිහා තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු " සංස්ථාව " යනුවෙන් සඳහන් කරනු ලබන) " සමස්ත ලංකා ශ්‍රී සුමංගල සමාජ සේවා සහ සුභසාධක සංගමය " යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්විය යුතු ය. තවද එකී නාමයෙන් එම සංස්ථාව විසින් ද එයට විරුද්ධවද සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය එම සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) පාසල් හැරයන තරුණ තරුණියන් සඳහා ආගමික පරිසරයක් තුළ ස්වයං රැකියා පුහුණුව ලබාදීම සඳහා විවිධ පාඨමාලා පැවැත්වීමට වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම ;

(ආ) ළමා සුභසාධනය හා පුනරුත්ථාපනය සඳහා සමාජ සේවා කටයුතු කිරීම ;

(ඇ) ස්වභාවික ව්‍යසනවලදී රටට එල්ල වන අභ්‍යන්තර හෝ බාහිර උපද්‍රවලදී සුදුසු පියවර ගැනීමට ක්‍රියා කිරීම සහ සහනාධාර සැපයීම ;

(ඈ) කලින් කල ආගමික උත්සව සංවිධානය කිරීම ;

(ඉ) බුද්ධාගම ඉගෙන ගැනීමට සහ පිළිපැදීමට උනන්දුවක් දක්වන සියලුදෙනාට රැස්වීම සඳහා ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් පිහිටුවීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාග පිළිගැනීමේ හෝ එකතු කිරීමේ ද තම අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයෙහි යෙදීමේ, සේවයේ නියුක්ත කිරීමේ හා සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් යමක් හෝ ඉටු කිරීමට හෝ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර සියළු කටයුතු, කාරණා හා දේවල් කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හා ඒ අනුව තෝරා පත්කර ගනු ලබන නිලධර යන්ගෙන් හා සෙසු තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත කළමනා කාර මණ්ඩලයක් විසින් තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සංගමයේ කළමනාකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් බඳවා ගැනීම, සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම, කළමනාකරණ මණ්ඩලය සහ වෙනත් නිලධරයන් තෝරා පත්කර ගැනීම, සංස්ථාවේ කළමනා කරණ මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටුකිරීම සහ සංස්ථාවේ හා කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින්, කලින් කල, සංස්ථාවේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ

බහුතර ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබිය හැකි ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ බලපැවැත් වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංගමයෙන් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති සංගමයේ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංගමයට අය විය යුතු හෝ ගෙවිය යුතු සියළු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන්නා වූ චංචල හෝ නිශ්චල දේපළක් භාරගෙන තබා ගැනීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇති අතර, ඒ සියළු දේපළ, ඒවා විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාවේ ගරු ප්‍රධාන ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, ගරු ප්‍රධාන ලේකම්වරයා ද ගරු සභාපතිවරයා හෝ ගරු භාණ්ඩාගාරිකවරයා යන දෙදෙනාගෙන් එක් අයකු ද ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙනින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන්ගේ හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි, කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.